# බළන්ගොඩ නගර සභාව
## 2020-06-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.06.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී | ජී.ඩී.ඒ.සේමපාල මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරිනිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-05-14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමී මැතිතුමා විසින් 2020-05-14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි ගරු සභාපතිතුමා විමසා සිටි අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් රු10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීමේ දී බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ගලි ප්‍රතිකාරක පද්ධතිය පුළුල් කර නව පෙරණයක් ඉදි කිරීම සඳහා සහාපති බුලත්ගම එක්සත් මිතුරු සංසඳය සඳහා ගෙවා ඇති මුදල රු.348,299.48 ක් ලෙස කොන්ත්‍රාත් ඇප ගිවිසුම් ලෙස තබා ගෙන ඇති මුදලද සමග සටහන් වී ඇති අතර එය රු.328,924ක් ලෙස නිවැරදි විය යුතු බවද, 05.01.09 යෝජනාව යටතේ (08 වන පිටුව) තමන් විසින් විෂබීජහරණ කුටියේ ප්‍රගතිය කුමක්දැයි විමසූ බවට සටහන් වී ඇති අතර එය ප්‍රමිතිය කුමක්දැයි විමසූ ලෙස නිවැරදි විය යුතු බව ද පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ඉදිරියේදී පැවැත්වෙන පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා තමන් නියෝජනය කරන පක්ෂය හා තමන් ඇළුම් කරන අපේක්ෂකයා සම්බන්ධ කර ගනිමින් සිදු කරනු ලබන මැතිවරණ ප්‍රවර්ධන වැඩසටහන් වලදී පොදු ස්ථාන හා විදුලි කණු වල දැන්වීම් ප්‍රදර්ශනය කිරීමෙන් වළකින ලෙසද මැතිවරණ කාර්යාල තුළ පමණක් දැන්වීම් ප්‍රදර්ශනය සිදු කරන ලෙසද එසේ නොමැති අවස්ථාවලදී පළකර ඇති දැන්වීම්, බැනර්, පෝස්ටර් ආදිය පක්ෂ භේදයකින් තොරව කපා ඉවත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.
- Covid-19 වසංගත තත්ත්වය හමුවේ බළන්ගොඩ නගරය ආරක්ෂා කිරීමෙහිලා බළන්ගොඩ නගර සභාව සාර්ථක වූ අතර ඉදිරියේදී හිස ඔසවන ඩෙංගු රෝගය පිළිබඳ ගැටළුව සම්බන්ධව අවධානය යොමු කළ යුතු බව පවසන ලදී. පසුගිය දිනෙක රත්නපුර දිස්ත්‍රික් පළාත් පාලන ප්‍රධානීන්, සෞඛ්‍ය ප්‍රධානීන් හා රජයේ ප්‍රධාන නිළධාරීන් පළාත් සභාවට කැඳවූ අවස්ථාවේදී ඩෙංගු රෝගය වළක්වාලීම පිළිබඳ සාකච්ඡා සිදු කළ අතර එහිදී ව්‍යාප්තිය වැළැක්වීම පිණිස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව ක්‍රමවේදයක් සකස් කළ බවද මෙම රෝගයේ ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ධූමායන කටයුතු සිදු කිරීම ඩෙංගු මදුරුවා විනාශ කිරීමේ ක්‍රමවේදයක් නොවන බවද එයින් මදුරු කීටයන් නොමැරෙන අතර පරිසරයේ සිටින ඉතිරි කුඩා සතුන් හා කෘමීන් විනාශ වීමෙන් පාරිසරික සමතුලිතභාවයට හානියක් වන බවට එහි දී පැවසූ බව සඳහන් කරන ලදී. ඒ

අනුව කොට්ඨාශයේ මන්ත්‍රීතුමා කොට්ඨාශය භාරව සිටින රජයේ නිළධාරීන් සමග සම්බන්ධ වී තම කොට්ඨාශයේ වගකීම ගනිමින් කටයුතු කළ යුතු බව පවසන ලදී.

**02. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- **ප්‍රජාශාලාව සඳහා ලබාදී ඇති ඉඩම නිරවුල් කර ගැනීම සම්බන්ධවයි.**

  ලක්සිරි උයනගම ප්‍රදේශවාසීන් වෙත ප්‍රජා ශාලාවක් හා ළමා උයනක් ඉදිකිරීම සඳහා ලබා දී ඇති ලොට් අංක 07 හා 11 යන බිම් කොටස් තුළ ප්‍රජාශාලාව සඳහා ගොඩනැගිල්ලක් හිටපු සභාපතිතුමාගේ කාලයේදී ලබා දුන් අතර, මෑතකදී යාබද ඉඩමේ (ලොට් අංක 06) හිමිකරු විසින්, ඉදිකර තිබූ වැට මායිම ගලවා බෝග වගා කර ඇති බැවින් රාජ්‍ය දේපලක් වන මෙම ඉඩම නිරවුල්කොට ලක්සිරි උයන ගම්වාසීන් වෙත ලබා දෙන ලෙස ලක්සිරි උයන ග්‍රාම සංවර්ධන හා සුභ සාධක සමිතිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා මෙය රජයේ දේපලක් වන බැවින් ඉහත සඳහන් කාර්යය ඉටු කර දෙන ලෙස පවසන ලදී.

  ගරු සභාපතිතුමා මේ පිළිබඳ කඩිනමින් වාර්තාවක් ලබා දෙන ලෙස වැඩ අධිකාරීතුමා වෙත දන්වන ලදී.

  ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් මෙම ග්‍රාමය ඉතා සහෝදරත්වයෙන් සියළු දෙනා එක්ව ජීවත් වන ග්‍රාමයක් වන බැවින් ඉහත සඳහන් සුභ සාධක සමිතිය වෙත එම ඉඩම මැන නිරවුල් කර නීත්‍යානුකූලව ලබා දෙන ලෙස ද මෙම ප්‍රදේශය දෙහිගස්තලාව කොට්ඨාශයේ පහළ කිරිමැට්ටිතැන්නට අයත් කොටසක් බව ද පවසන ලදී.

- **බළන්ගොඩ මුගුණමලේ මාර්ගයේ දෙරවෙල ඔය හරහා තිබූ පාලමට හානි සිදු වීම.**

  බළන්ගොඩ නගර සීමාවට අයත් මුගුණමලේ පාරට ප්‍රවේශ වීමට දොරවෙල ඔය හරහා සකස් කර තිබූ පාලමට 2020.05.19 වන දින ගලා ආ ගංවතුර නිසා හානි සිදු ඇති බැවින් ප්‍රදේශවාසී ජනතාව දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇති බවද නගරයට පිවිසීමට තිබූ කෙටිම මාර්ගය වන මෙම පාලම යෝජිත නව නගර සැලැස්ම අනුව සකස් කිරීමට කාලයක් ගත වන බැවින් එය සකස් කර දෙන තෙක් ප්‍රදේශයේ ජනතාවගේ ගමනාගමන පහසුව සඳහා තාවකාලික ඒදණ්ඩක් හෝ යොදා ගමන් කිරීමට හැකිවන ලෙස සකස් කර දෙන මෙන් මුගුණමලේ ගම්වාසීන් විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා මෙය කාලෝචිත යෝජනාවක් වන බව පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මෙම මාර්ගය සඳහා ඒදණ්ඩක් ප්‍රමාණවත් නොවන බැවින් පාලමක් යොදන ලෙස පවසන ලදී.

- **බෝම්බුව නිල්වලා ක්‍රීඩා පිටියේ දැල් ආවරණය පුළුල් කර ගැනීම සම්බන්ධවයි.**

  බෝම්බුව නිල්වලා ක්‍රීඩා සමාජය විසින් භාවිතා කරනු ලබන බෝම්බුව ක්‍රීඩා පිටියේ දැල් ආවරණය සිදු කර ඇත්තේ ක්‍රීඩා පිටියේ එක් පැත්තක වන බව ද ක්‍රීඩා පිටිය සෘජුවම මාර්ගයට විවෘතව පවතින අතර ක්‍රීඩා කිරීමේදී වොලිබෝලය මාර්ගයට පැමිණෙන නිසා මාර්ගයේ ගමන් කරන වාහන හා මිනිසුන් සඳහා අනතුරක් සිදුවිය හැකි බව ද සඳහන් කරමින් මාර්ගයට විවෘතව පවතින මායිම සඳහා දැල් ආවරණයක් ලබා දෙන ලෙසත්, ක්‍රීඩා උපකරණ ආරක්ෂිතව ගබඩා කර තැබීම සඳහා බෝම්බුව සේවා පියසේ ගොඩනැගිල්ලේ කොටසක් හෝ සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙසත් පවසමින් බෝම්බුව නිල්වලා ක්‍රීඩා සමාජය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසා සිටියේ දැල් ආවරණය යෙදීමේදී ඒ සඳහා යන වියදමින් කොටසක් තම මන්ත්‍රී ප්‍රතිපාදන තුළින් ලබා දෙන බවයි.

- **පොදු වෙළෙඳසැල අංක 03 දරණ කඩ කාමරය ලබා ගැනීම සම්බන්ධවයි.**

  මුගුණමලේ, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි පී. සුජිත් කුමාර මහතා විසින් පොදු වෙළඳෙසැල අංක 03 දරණ කඩ කාමරය ටෙන්ඩර් ලබා ගත් පුද්ගලයා මේ වන තෙක් එම කඩ කාමරය සඳහා කිසිඳු මුදලක් ගෙවා නොමැති බැවින් රු.4,000.00 ක මුදලට එම කඩ කාමරය ලබා දෙන ලෙස ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>

- **රෝහල් භූමියේ සැරිසරන සුනඛ ගහනය සම්බන්ධවයි.**

  බළන්ගොඩ මූලික රෝහලේ සැරිසරන සුනඛ ගහනය ඉහළ යාම සහ සුනඛයින්ගේ සපා කෑම් හේතුවෙන් රෝහල් කාර්ය මණ්ඩලය මෙන්ම පැමිණෙන රෝගීන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවද පුද්ගලයින් 09 දෙනෙකු රෝහල් භූමිය තුළදී සුනඛයින්ගේ සපා කෑම්වලට ලක්වී ඇති බැවින් රෝහල් භූමියෙන් සුනඛයින් ඉවත් කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස සඳහන් කරමින් වෛද්‍ය අධිකාරිතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

04. කල් දී ඇති ප්‍රශ්න

**04.01. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

04.01.01 වැසිකිළි සඳහා ලබා දෙන රු. 50,000.00 ක මුදල ඉදිරියේ දී දීමට හැකි ද? ඒ සම්බන්ධව පැහැදිලි කරන්න.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ වැසිකිළි ආධාර ලබා ගැනීමට අදාළ ලියකියවිලි සම්පූර්ණ කර අනුමැතිය සඳහා පළාත් සභාව වෙත යවා ඇති අතර, අනුමැතිය ලැබුණු විගස වැසිකිළි ආධාර ලබා දෙන බවයි.

05. කල් දී ඇති යෝජනා

**05ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

05.01.01 GK-1483 ට්‍රැක්ටරය සඳහා 90 Amp බැටරියක් ලබා ගැනීම සඳහා චමින්ද බැටරි මාට් වෙතින් ඉදිරිපත් කර ඇති රු.20,250.00 ක මිළ ගණන් අනුමත කිරීම. (Lucas බැටරියකි)

GK-1483 ට්‍රැක්ටරය සඳහා 90 Amp බැටරියක් ලබා ගැනීම සඳහා චමින්ද බැටරි මාට් වෙතින් ඉදිරිපත් කර ඇති රු.20,250.00 ක මිළ ගණන් අනුමත කර එය මිළදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.02 HF -7899 JCB රථය සඳහා 120 Amp බැටරියක් ලබා ගැනීම සඳහා චමින්ද බැටරි මාට් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 26,425.00 ක මිළ ගණන් අනුමත කිරීම.

HF -7899 JCB රථය සඳහා 120 Amp බැටරියක් ලබා ගැනීම සඳහා චමින්ද බැටරි මාට් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 26,425.00 ක මිළ ගණන් අනුමත කර එය මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.03 227-5020 ගලි බවුසරයේ ක්ලච් පොම්පය ගලවා නව ක්ලච් පොම්පයක් දැමීම, බ්‍රේක් ඔයිල් දැමීම සඳහා තෙඹුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.11,480.00 ක මිළ ගණන් අනුමත කිරීම.

227-5020 ගලි බවුසරයේ ක්ලච් පොම්පය ගලවා නව ක්ලච් පොම්පයක් දැමීම, බ්‍රේක් ඔයිල් දැමීම සඳහා ඉදිරිපත් කර ඇති රු.11,480.00 ක මිළ ගණන් අනුමත කර එම අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.04 ZA-5039 JCB යන්ත්‍රයේ ඉදිරිපස ඩිපරංසලයේ ශබ්දයක් එන බැවින් පරීක්ෂා කර බලා අලුත්වැඩියා කිරීමට හා යන්ත්‍රයේ පසු පස කොටස් ගෙවී ඇති බැවින් එය පරීක්ෂා කර අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.05 56-1906 කෘෘ කැබ් රථයේ ඉදිරි වීල් සිලින්ඩර හතර හා පසුපස වීල් සිලින්ඩර හතර අලුතෙන් යොදා සවිකර තිරිංග පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා නැෂනල් මෝටර්වේස් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 38,250.00 ක මිළ ගණන් අනුමත කිරීම.

56-1906 කෘෘ කැබ් රථයේ ඉදිරි වීල් සිලින්ඩර හතර හා පසුපස වීල් සිලින්ඩර හතර අලුතෙන් යොදා සවිකර තිරිංග පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා නැෂනල් මෝටර්වේස් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 38,250.00 ක මිළ ගණන් අනුමත කර එම අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.06 RC-8183 ට්‍රැක්ටරයට ක්ලච් ප්ලේට්, ප්‍රෙෂර් ප්ලේට් දැමීම සඳහා විමල් ඇග්‍රෝ ට්‍රැක්ටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.43,290.00 ක මිළ ගණන් අනුමත කිරීම.

RC-8183 ට්‍රැක්ටරයට ක්ලච් ප්ලේට්, ප්‍රෙෂර් ප්ලේට් දැමීම සඳහා විමල් ඇග්‍රෝ ට්‍රැක්ටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.43,290.00 ක මිළ ගණන් අනුමත කර එම අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.07 RE 2600 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.08 බළන්ගොඩ ජැකලංකා ඇපරල් පුද්ගලික සමාගමේ ඉල්ලීම අනුව පසුව ගෙවීමේ පදනම මත 2007 වර්ෂයේ දී ගලි බවුසරයේ සේවය ලබා දී ඇති අතර ඒ සඳහා ගෙවිය යුතු රු.68,800.00 ක මුදල එම සමාගම ඇවර කිරීම මත සභාවට ලැබී නොමැත. එමෙන්ම පසුව ගෙවීමේ පදනම මත ගලි බවුසර් සේවාව ලබා දීමේ පදනමක් නොමැති බවට පළාත් පාලන කොමසාරිස්ගේ CLG/11/7/2 හා 2018.08.31 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර, පසුව ගෙවීමේ පදනම මත සේවාව ලබා දීමේ තීරණය ගැනීමට කටයුතු කළ අයගෙන් එකී මුදල අය කරගැනීම සිදු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව එවකට විෂය භාර නිළධාරි ලෙස කටයුතු කළ දර්ශා ජයසිංහ මහත්මියගේ වැටුපෙන් එය අය කර ගැනීමට කටයුතු කළ අවස්ථාවේදී ඇය විසින් ඇගේ වැටුපෙන් එම මුදල අයකර නොගන්නා ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධව සභා තීරණයක් ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මෙම සමාගම ඇවර කිරීමේදී සමාගමට ලැබෙන වන්දි මුදලින් මෙම මුදල පියවී නොමැති දැයි විමසන ලදී. මෙයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ එම අවස්ථාවේදී අප සභාව මේ සඳහා සම්බන්ධ වී නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා පවසා සිටියේ මෙම සිදුවීම 2007 වර්ෂයේ සිදුවූ සිදුවීමක් වන අතර එසේ දිගු කලකට ඉහත දී සිදුවූ දෙයක් වෙනුවෙන් තීන්දුවක් ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් ඒ සඳහා නියෝගය ලබා දී ඇති පළාත් පාලන කොමසාරිස්ගේ CLG/11/7/2 හා 2018.08.31 දිනැති ලිපිය සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, ඒ අනුව මෙය අදාළ නිළධාරිණිය අතින් සිදු වූ අතපසුවීමක් ද නැතහොත් වෙනත් ප්‍රශ්නයක් ද යන්න එමගින් දැනගත හැකි වන බවත් ය. අනතුරුව ගරු සභාපතිතුමා විසින් දර්ශා ජයසිංහ මහත්මිය ඉදිරිපත් කර ඇති අභියාචනාව සමඟ අදාළ ලිය කියවිලි සභාවට ඉදිරිපත් කරන ලදී. එහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, එවකට හිටපු සභාපතිතුමාගේ උපදෙස් පරිදි මෙම ගලි බවුසර් සේවාව ලබා දී ඇති අතර එම සේවාව අවශ්‍ය බවට ඇයට ඉල්ලීම ලැබෙන විටත් ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි මෙම සේවාව ලබා දී ඇති බවත්, විවිධ අවස්ථාවන් වලදී විගණන විමසුම්වලට මෙම කාරණය භාජනය වන බැවින් මේ සඳහා තීරණයක් ගත යුතු බවත් පවසන ලදී.

මේ පිළිබඳව ගණකාධිකාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ගණකාධිකාරිතුමාගෙන් කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙම කාරණය නිසා අදාළ නිළධාරිණිය මේ වන විට අසරණ තත්ත්වයකට පත්ව ඇති බැවින් එම සමාගම ඇවර කිරීමේ කටයුතු සිදු කිරීමේදී රජය මඟින් ලැබෙන වන්දි මුදල ලැබුණු පසු එම මුදල පියවා ගන්නා තෙක් ඇයගෙන් අය නොකර සිටීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ප.ව.12.07 ට පමණ සභාව වෙත පැමිණෙන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, මෙම මුදල අදාළ නිළධාරිණියගෙන් අය කිරීම වැරදි ක්‍රියාවක් බව ද අද වුවත් පුද්ගලික හා රජයේ ආයතන සඳහා මෙසේ ගලිබවුසර් සේවාව ලබා දෙන බව ද පවසන ලදී. එබැවින් අද දින සභාවේ තීන්දුවක් ගෙන මෙම සමාගම ඇවර කිරීමෙන් පසු රජයෙන් ලැබෙන වන්දි මුදලින් මෙය පියවා ගන්නා තෙක් ගරු ආණ්ඩුකාරතුමාට ඉල්ලීමක් කර මෙම චෝදනාවෙන් ඇයව නිදහස් කර දෙන ලෙස පවසන ලදී. එමෙන්ම මේ නඩුව සඳහා සභාවට ඉදිරිපත් විය

හැකිව තිබූ නමුත් ඒ සඳහා විශාල වියදමක් යන බැවින් ඒ සඳහා සහභාගි නොවූ බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ පළාත් පාලන කොමසාරිස්තුමා විසින් මෙය අයකර ගන්නා ලෙස ලේකම්තුමියට නියෝගයක් එවා ඇති බැවින් දර්ශා ජයසිංහ මහත්මියගේ අභියාචනාව හා අද දින ලබා ගන්නා සභා තීන්දුව සමඟ පළාත් සභාව වෙත යොමු කිරීම සුදුසු බවයි. එමෙන්ම කිසිදු කරුණු විමසීමකින් තොරව ඇයගෙන් මෙම මුදල අය කර ගන්නා ලෙස පවසා ඇති බව ද මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු සිදු කර අවසන් වන කර රජයෙන් ලැබෙන වන්දි මුදල ලබා ගන්නා තෙක් මෙම නිළධාරිනියගෙන් අයකර නොගැනීම සඳහා තීන්දුවක් ගැනීම සුදුසු බව ද පවසන ලදී.

ඒ අනුව ජැකලංකා ඇපරල් පුද්ගලික සමාගම ඈවර කිරීමේදී රජයෙන් ලැබෙන වන්දි මුදල ලැබුණු පසු මෙම මුදල අයකර ගන්නා තෙක් දර්ශා ජයසිංහ මහත්මියගේ වැටුපෙන් අය නොකර සිටීමටත් මෙම කරුණ සම්බන්ධයෙන් ඇය නිදහස් කර දෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමා වෙත දැන්වීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්ටීඑම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.09 ND - 5124 වැන් රථයේ පහත සඳහන් සේවා ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- පූර්ණ සේවා සිදු කිරිම.
- ඒ.සී පද්ධතිය අලුත්වැඩියා කිරීම.
- බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.10 ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පහත සඳහන් ද්‍රව්‍ය ලබා දීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන පහත සඳහන් පරිදි අනුමත කිරීම.

| වර්ගය | අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය | අවම මිළ ගණන් |
|---|---|---|
| ලීටර් 10 බත් භාජන දෙකක්, ලීටර් 07 භාජන 02ක්, ලීටර් 05 ප්‍රමාණයේ භාජන 03ක් (සිල්වර්/රවුම් හැඩති) මිළදී ගැනීම | ජෙස්මින් ඇලුමිනියම් | රු.33,400.00 |
| ජී.අයි.හෙවි 3/4" බට | පී.එම්.කේ.හාඩ්වෙයාර් | රු. 1,950.00 |
| ප්ලාස්ටික් පුටු (නිල්කමල්) | චතුර ෆර්නිචර්ස් | රු. 915.00 |
| ශබ්ද විකාශන යන්ත්‍ර කට්ටල සඳහා | වැලිගම ඉලෙක්ට්‍රිසිටි | රු.34,999.00 |
| 10'X20'හට් (අමානෝ ෂීට් හා ජී අයි බට වලින් නිර්මිත) | ගවේෂි අයන් වර්ක්ස් | රු.83,850.00 |

ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉහත සඳහන් ද්‍රව්‍ය ලබා දීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අනුමත කර අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.11 සභාවේ කර්මාන්ත ඉටු කිරීමට පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව සුදුසු ආයතනයක් තෝරා ගැනීම.

| අයිතමය | ආයතනය | වර්ගය | මිළ |
|---|---|---|---|
| 12 mm කම්බි | තිරණ සප්ලයර්ස් | මෙල්වා | රු.810.00 |
| | | මෙල්වන් | රු.780.00 |
| සිමෙන්ති | | Expo | රු.950.00 |
| | | අල්ට්‍රාටෙක් | රු.980.00 |
| පොලිතීන් | | | රු.240.00 |
| බයින්ඩින් | | | රු.245.00 |
| 10mm කම්බි | | මෙල්වා | රු.590.00 |
| | | මෙල්වන් | රු.560.00 |
| 12 mm කම්බි | රේණුක හාඩ්වෙයාර් | මෙල්වා | රු.795.00 |
| | | මෙල්වන් | රු.670.00 |

| | | | |
|---|---|---|---|
| සිමෙන්ති | | සමුද්‍රා | රු.920.00 |
| | | මෙරීන් | රු.950.00 |
| | | අල්ට්‍රාටෙක් | රු.990.00 |
| පොලිතීන් | | | රු.190.00 |
| බයින්ඩින් | | | රු.290.00 |
| 10mm කම්බි | | මෙල්වා | රු.540.00 |
| | | අශොක් | රු.470.00 |
| 12 mm කම්බි | හිෂාම් හාඩ්වෙයාර් | ආර්.එස් | රු.760.00 |
| සිමෙන්ති | | මෙරින් | රු.960.00 |
| පොලිතීන් | | | රු.200.00 |
| බයින්ඩින් | | | රු.320.00 |
| 10mm කම්බි | | ආර්.එස්. | රු.530.00 |
| 12 mm කම්බි | පී.එම්.කේ.හාඩ්වෙයාර් | සිංහ | රු.735.00 |
| සිමෙන්ති | | මෙරින් | රු.985.00 |
| පොලිතීන් | | | රු.240.00 |
| බයින්ඩින් | | | රු.300.00 |
| 10mm කම්බි | | සිංහ | රු.525.00 |

සභාවේ කර්මාන්ත ඉටු කිරීම සඳහා ඉහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතනයෙන් එම ද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.12 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

| **වර්ගය** | **ප්‍රමාණය** |
|---|---|
| ලයිෆ්බෝයි | 1000 |
| A4 | බන්.100 |
| ඉදල් | 100 |
| කොසු | 50 |
| ටිපෙක්ස් | 20 |
| හයිලයිට් පෙන් | 20 |
| පෝස්ට් ඉට් පැකට් (පොඩි) | 10 |
| CR II | 10 |
| Bloodo clip | 30 |

| | |
|---|---|
| ලොකු සෙලෝටේප් | 30 |
| පොඩි සෙලෝටේප් | 25 |
| පොඩි ගම් | 20 |
| පොඩි සබන් | 250 |
| එයාර්ප්‍රෙෂ්නර් | 10 |
| නෝමල් ෆයිල් | 400 |
| දෙපියන් ෆයිල් | 100 |
| පාට A4 (රෝස,රතු,කොළ) | බන්.03 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.13 බළන්ගොඩ නගර සභාව සතු නව බස්නැවතුම්පල ඩී/11/01 හා සී 46 කඩ කාමර මුද්‍රා තබා ඇති අතර මේ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව සභා තීරණයක් ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත කඩ කාමර දෙකෙහිම කඩ කුලිය නොගෙවීම මත කඩ කාමර මුද්‍රා තබා ඇති අතර මෙම කඩ කාමර ටෙන්ඩර් කළ යුතු බවත් ඒ සඳහා අවම ලංසු මුදල තීරණය කර ගත යුතු බවත්ය.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් ඩී 11/01 රු.10,000.00 ක මුදලකට හා සී 46 කඩ කාමරය රු.3,500.00 ක් ලෙස අවම ලංසු මුදල තීරණය කර යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ටෙන්ඩර් කළ මුදලට ටෙන්ඩර් කළ යුතු බවත්, එම අවස්ථාවේ ටෙන්ඩරය කවුරුත් නොගන්නේනම් පමණක් ගණන අඩු කර ලබා දිය හැකි අතර එසේ නොමැතිව එකවර ලංසු මුදල අඩු කරන්නේනම් පළාත් සභාවට යවා අනුමැතිය ලබා ගත යුතු බවත් පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඉහත කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කළහොත් විශාල මුදලක් වැය වන බැවින් සීමිත ටෙන්ඩර්පත් කැඳවීම සුදුසු බවට ද ඩී 11/01 කඩ කාමරය සඳහා රු.10,000.00 ක මුදලක් හා සී 46 කඩ කාමරය සඳහා රු.3,500.00 මුදලක් ලෙස අවම ලංසු මුදල තීරණය කිරීම සුදුසු බවට ද කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.14 පහත නම් සඳහන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 06 දෙනා සභාවේ නිලධාරීන් වශයෙන් පිළිගැනීම

- අඳාදොල මනන්නලාගේ චමිල් ලක්ෂාන් ආඳාදොල මහතා
- රත්තරන් අරාවේ නිමල් වසන්ත මහතා
- සුමේධ සම්පත් ගමගේ මහතා
- ගල්ගොඩගේ චමින්ද මහේෂ් සෝමතුංග මහතා
- සේනාධීර හපුතන්ත්‍රිගේ ගයාන් සංජීව මහතා
- ඩබ්. අමල් නිශ්ශංක ඉන්ද්‍රජිත් වීරසේකර මහතා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ලංකා නීති ප්‍රඥප්තියේ 255 අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ සභාපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍යයට අදාළව පහත සඳහන් නීති,පනත්,අතුරු ව්‍යවස්ථා හා ආඥා පනත් මඟින් මෙම සභාවට පැවරී ඇති බලතල කාර්යය හා කර්තව්‍ය සභාපතිවරයාගේ පොදු පාලනයට යටත්ව ඉහත නම් සඳහන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට ඔවුන් විසින් රාජකාරි ඉටු කරනු ලබන ක්ෂේත්‍රයන් ඇතුළත සහ රාජකාරි ආවරණය කරනු ලබන ක්ෂේත්‍රයන් ඇතුළත්දී ක්‍රියාවේ යෙදවීම පිණිස මෙයින් බලය පවරනු ලැබේ.

**බලතල පවරන ආඥා පනත්, පනත් හා අතුරු ව්‍යවස්ථා -**

01. නගර සභා ආඥා පනතේ IV වන කොටසේ මහජන සෞඛ්‍යයට අදාළ වගන්ති සහ සභාපතිවරයා විසින් අවස්ථානුකූලව පවරනු ලබන අනෙකුත් වගන්ති
02. නගර සභා පනතේ 36 වගන්තියෙහි (උ) (එ) උප වගන්ති
03. 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා)
04. බළන්ගොඩ නගර සභාව විසින් පනවා ඇති අනෙකුත් අතුරු ව්‍යවස්ථාවල මහජන සෞඛ්‍යට අදාළ කොටස්
05. 230 වන අධිකාරිය වූ පීඩන ක්‍රියා ආඥා පනත
06. 1893 අංක 09 දරණ ගෝ ඝාතක ආඥා පනත
07. 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ පරිසර දූෂණයන්ට අදාළ හා පරිසර බලපත්‍රවලට අදාළ කරුණු පරීක්ෂා කිරීම, වාර්තා කිරීම හා අවශ්‍ය විටක සභාපති හෝ ලේකම් වෙනුවෙන් අධිකරණයෙහි පෙනී සිටීම.
08. පුද්ගලික සුසාන හා පොදු සුසාන පිළිබඳ ආඥා පනත
09. 268 වන අධිකාරිය වූ ගෘහ හා නගර සංවර්ධන ආඥා පනත
10. 1941 අංක 13 දරණ ජලභීතිකා රෝගය පිළිබඳ ආඥා පනත
11. 1838 අංක 26 දරණ බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත
12. 222 වන අධිකාරිය වූ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.15 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම

- RD-8240 ට්‍රැක්ටරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ස්ටේෂන් වෙත ගෙවිය යුතු රු.10,920.00 ක බිල්පත අනුමත කිරීම.
- බැංකියවත්ත වැහිපීලි සකස් කිරීම සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.25,065.00 ක මුදලක් ගෙවීම.
- පොළ,පොදුවෙළෙඳසැල,බස්නැවතුම්පල ඉදිරිපස කාණු සඳහා ප්ලේට් යෙදීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීමට පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.48,735.00 ක මුදලක් ගෙවීම.
- බැංකියවත්ත කසළ අංගනයට දුගඳ නාශක ලීටර් 60ක් මිළදී ගැනීම සඳහා යුනයිටඩ් ග්ලාස් සෙන්ටර් වෙත රු.150,000.00 ක මුදලක් ගෙවීම.
- 2020.05.01 දින සිට 2020.05.31 දක්වා ඉන්ධන බිල්පත් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

  ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.16 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020.05.06 | 2020.04.01 සිට 2020.04.30 දක්වා පොහොර හැලීම හා වෙන් කිරීම සඳහා වැටුප් ගෙවීම | 12-3 | 011865 | 125,925.00 |
| | 2020.04.01 සිට 2020.04.30 දක්වා කසළ ඉවත් කිරීම සඳහා කම්කරුවන් හා රියදුරන් යොදා ගැනීම | 12-4 | 011865 | 172,500.00 |
| | 2020.04.01 සිට 2020.04.30 දක්වා බස්නැවතුම්පල වැසිකිළි නඩත්තුකරු, සම්පත් පියස කම්කරුගේ වැටුප් ගෙවීම | 12-5 | 011865 | 31,200.00 |
| | කොන්ත්‍රාත් පදනමේ කම්කරු වැටුප් -කර්මාන්ත -2020.04.01 සිට 2020.04.30 | 12-8 | 011865 | 53,300.00 |
| | කොන්ත්‍රාත් කම්කරු වැටුප් - කර්මාන්ත 2020.04.01 සිට 2020.04.30 | 12-9 | 011865 | 41,400.00 |
| | ජිනසිරි සහෝදරයෝ- 2020 මාර්තු මස සඳහා කියවීම් ශාලාවට පුවත්පත් හා සඟරා සැපයීම | 18 | 011879 | 10,090.00 |
| 2020.05.11 | මධ්‍යම පරිසර අධිකාරිය - ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු ගෙවීම. | 38 | 011892 | 17,700.00 |
| 2020.05.13 | ලංකා විදුලි බල මණ්ඩලය - මහජන පොළ, පොදු වෙළෙඳසැල වැසිකිළිය ,මුරකුටිය , දොරවෙල ගබඩාව යන ස්ථානවල මාර්තු හා අප්‍රේල් මස සඳහා විදුලි බිල් ගෙවීම | 41 | 011895 | 20,719.85 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - කාර්යාලය හා නගර සභාවට යාබද ගොඩනැගිල්ල සඳහා මාර්තු හා අප්‍රේල් මස බිදුලි බිල් ගෙවීම | 42 | 011895 | 63,662.20 |
| 2020.05.14 | සභාපති, අනඳමෛත්ගම ජ්‍යෙෂ්ඨ පුරවැසි | 55 | 011912 | 35,895.93 |

| | | | | |
|---|---|---|---|---|
| | සංවිධානය - මැද කිරිදිගල ශෛලතලාරාම මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා 10%ක රඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැම්පත් මුදල් ගෙවීම. | | | |
| 2020.05.18 | සභාපති,කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය- වැලිහරනාව මාර්ගය දෙපස කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රඳවුම් මුදල් ගෙවීම. | 58 | 011915 | 90633.45 |
| 2020.05.22 | සුහසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - කිව්ලේවෙල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම ව්‍යාපෘතියේ වැඩ අවසන් මුදල ගෙවීම | 64 | 011943 | 84,975.00 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය- 2020.04.01 සිට 2020.04.14 දක්වා ඉන්ධන බිල්පත් පියවීම. | 75 | 011948 | 114,014.00 |
| 2020.05.27 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය- 2020 මාර්තු/අප්‍රේල්/මැයි මස දොරවෙල ගබඩාව, පොදුවෙලෙඳසැල, මහජන පොළ ජල බිල් ගෙවීම. | 87 | 011960 | 31,708.76 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය- 2020.03.10 සිට2020.04.30 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 101 | 011966 | 51,690.00 |
| | | | | |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය- 2020.04.30 සිට 2020.05.11 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 102 | 011966 | 86,538.95 |
| 2020.06.02 | Gestntner of Ceylon PLC- ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ෆොටෝ කොපි ටෝනර් 03 ක් මිළදී ගැනීම | 05 | 011974 | 22,680.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා ගරු ආණ්ඩුකාරතුමාගේ සාකච්ඡාවේදී තීරණය කර ගත් පරිදි අත්‍යවශ්‍ය වියදම් සඳහා පමණක් ආවරණ අනුමැතිය ලබා ගන්නා ලෙස ද ඉතිරි යෝජනා සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම කළ යුතු බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.17 කිරිඳිගල ජයතුංග මල්ශාලාව අළුතින් ආරම්භ කිරීම සඳහා ඉල්ලීම් කර ඇති අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මල්ශාලාව සම්බන්ධව අඩුපාඩු පවතින බවට බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ නිර්දේශය සහිතව ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවයි. එබැවින් අදාළ

අඩුපාඩු සම්පූර්ණ කළ පසු බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ නිර්දේශය මත ලබා දීම සුදුසු බව සභාවේ මතය විය.

05.01.18 බළන්ගොඩ, නව පොළ පාර, නො. 157/2 ඩී, ලිපිනයේ පදිංචි එම්. ඩබ්. ඒ. යූ. අනුරාධ යන විසින් කොම්පෝස්ට් පොහොර සඳහා ගෙවූ මුදල් ආපසු ලබා ගැනීම - රු 6,250.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත නම සඳහන් පුද්ගලයා විසින් කොම්පෝස්ට් පොහොර 50Kg බැගින් වන පොහොර මිටි 50 ක් සඳහා රු.12,500.00 මුදල් ගෙවා පොහොර මිටි 25 ක් ගෙන ගිය අතර ඉතිරි පොහොර අනවශ්‍ය බැවින් ඒ සඳහා ගෙවූ ඉතිරි මුදල වන රු.6,250.00 ආපසු ගෙවන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.19 නව බස්නැවතුම්පල පොලිස් මුරපොළ හා මුරකුටිය ඉදි කිරීමේදී ඇළුමිනියම් දොර හා පාටිෂන් කිරීම සඳහා සෙවන ග්ලාස් හවුස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු.132,000.00 ක මිළ ගණන අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.20 2019 - භාණ්ඩ සමීක්ෂණ හා අපහරණ ක්‍රියාවලිය සිදුකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව භාණ්ඩාගාර 66 හි අතිරික්ත භාණ්ඩ ලෙස සඳහන් භාණ්ඩ කල්පවත්නා භාණ්ඩ ලේඛනවලට ඇතුළත් කිරීමටද භාණ්ඩාගාර 66 හි "S" අක්ෂරයෙන් හා "D" අක්ෂරවලින් සඳහන් භාණ්ඩ කල්පවත්නා ලේඛන වලින් ඉවත් කිරීමටත් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.21 රට තුළ පවතින කොවිඩ් 19 වසංගතය තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, හා ව්‍යාපාර බදු අයකිරීමේ කාල සීමාව දීර්ඝ කිරීම, බස් රථ ටෙන්ඩරයේ ගාස්තු අය කිරීම,දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම හා තානායම් කුලිය අයකිරීම පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා බී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ පසුගිය මහ සභාවේදී කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපාරික ප්‍රජාවට හා මහජනතාවට සහන සැලසීමේ අරමුණෙන් තීරණ අංක 05.01.12 යටතේ ලබා ගත් ඉහත සඳහන් වන කරුණු සම්බන්ධ තීරණ සංශෝධනය කළ යුතු බවයි. එනම් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, හා ව්‍යාපාර බදු අයකිරීමේ කාල සීමාව 2020 ජූලි 31 දක්වා දීර්ඝ කිරීම සඳහා ගත් සභා තීරණයෙහි සඳහන් එම කාල සීමාව ප්‍රමාණවත් නොවන බවත්, තානායම් කුලිය අයකිරීම පිළිබඳ පැහැදිලි තීරණයක් ලබා නොගත් බැවින් නැවත වරක් එම තීන්දුව ගත යුතු බවත් ය.

එමෙන්ම බස් රථ ටෙන්ඩරයේ ගාස්තු ඇඳිරිනීතිය ක්‍රියාත්මක දිනයන්හි දී අය නොකර සිටීමටත්, ඇඳිරි නීතිය නොමැතිව දින පහකට වඩා වැඩි කාලයක් පැවති දිනවලදී අය කර සිටීම සුදුසු බවටත් පසුගිය සභාවේදී තීරණය කළ නමුත් මාර්තු මස ඇඳිරි නීතිය ක්‍රියාත්මක කළ දින සිට නැවත රට සාමාන්‍ය තත්ත්වයට පත්වන තුරු බස්රථ ධාවනය නොකළ බැවින් එම තීරණය සංශෝධනය කර දෙන ලෙස බස් රථ ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් කර තිබූ බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා දැන්වීම් පුවරු සඳහා 2020 මාර්තු,අප්‍රේල් හා මැයි යන මාස තුනෙහිම දැන්වීම් පුවරු ගාස්තු අය නොකර සිටීම සඳහා සභා තීරණයක් ගත් නමුත් අනෙකුත් සියළුම වර්ගයේ බදු කුලී මාර්තු මස 50%ක් අය කළ බැවින් දැන්වීම් පුවරු සඳහා ද මාර්තු මස කුළියෙන් 50%ක් අය කිරීම සුදුසු බව පවසන ලදී.

එබැවින් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, හා ව්‍යාපාර බදු අයකිරීමේ කාල සීමාව 2020 සැප්තැම්බර් 31 දක්වා දීර්ඝ කිරීම සුදුසු බව ද, තානායම් කුලිය 2020 මාර්තු මස 50% අය කිරීමට ද, අප්‍රේල් හා මැයි මස සඳහා අය නොකළ යුතු බවද සභාවේ මතය විය. එමෙන්ම බස් රථ ටෙන්ඩරයේ ගාස්තු 2020 මාර්තු මස 50%ක් අයකිරීමටත්, අප්‍රේල් හා මැයි මස අය නොකර සිටීමටත්, ජූනි මස 75% ක් අය කිරීමටත් දැන්වීම් පුවරු සඳහා ගාස්තු මාර්තු මස 50% න් අය කිරීමටත්, අප්‍රේල් හා මැයි මස අය නොකර සිටීමටත් සුදුසු බව සභාවේ මතය විය.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ව්‍යාපාර බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, හා ව්‍යාපාර බදු අයකිරීමේ කාල සීමාව 2020 සැප්තැම්බර් 31 දක්වා

දීර්ඝ කිරීමට තීරණය විය. එහි දී තානායම් කුලිය 2020 මාර්තු මස කුලිය 50% ක් අය කිරීමටත්, අප්‍රේල් හා මැයි මස සඳහා අය නොකර සිටීමටත් බස් රථ ටෙන්ඩරයේ ගාස්තු 2020 මාර්තු මස 50%ක් අයකිරීමටත්, අප්‍රේල් හා මැයි මස අය නොකර සිටීමටත්, ජූනි මස 75% ක් අය කිරීමටත් දන්වීම් පුවරු සඳහා ගාස්තු මාර්තු මස 50% ක් අය කිරීමටත්, අප්‍රේල් හා මැයි මස අය නොකර සිටීමටත් සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

05.01.22 එගොඩවත්ත පාර සාදා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

එගොඩවත්ත මාර්ගය සම්පූර්ණ ප්‍රාණය අඩි 150ක් පවතින අතර එයින් අඩි 50 ක් සාදා අවසන් අතර ඉතිරි අඩි 100 සාදා ගැනීමට අවශ්‍ය කරන පහත සඳහන් අමුද්‍රව්‍ය ලබා දෙන ලෙස ගම්වාසීන් විසින් ඉල්ලීමක් සිදු කර ඇති බව පවසන ලදී.

**අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ප්‍රමාණය**

| | | |
|---|---|---|
| 01. කලුගල් ලෝඩ් | - | 06 |
| 02. මැටල් ලෝඩ් | - | 02 |
| 03. සිමෙන්ති | - | 30 |
| 04. වැලි කියුබ් | - | 03 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06. මන්ත්‍රී යෝජනා

**06.01 ගරු නාගරික මන්ත්‍රීනි පී.චන්ද්‍රලතා මැතිතුමිය**

06.01.01 හුණුකුඹුර - බලංගොඩ ගෙදර අතුරු මාර්ගයේ පහළ කොටස බාදනයට ලක් වී ඇති බැවින් එම කොටසට අවශ්‍ය කරන කාණු පද්ධතියට අවශ්‍ය මුදල් මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබාදෙන ලෙස ඉල්ලා සිටීම.

06.01.02 දොරවෙල ඔය ඉහළ මාර්ගයේ ගස් කඩා වැටීම නිසා ගංවතුර අවදානමට පසුගිය වර්ෂා කාලයේ හේතු වී තිබූ බැවින් එම ගස් හැකි ඉක්මනින් කපා ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම.

06.01.03 හුණුකුඹුර - බළන්ගොඩ ගෙදර පහළ කොටසේ නිවාස අසළින් 200m පමණ දිග කානු පද්ධතියක් හරස්වීම නිසා ගංවතුර කාලයට මෙම කාණුව උතුරා යාම නිසා නිවාස යට වීමේ අවදානමක් පැවතෙන බැවින් එම කාණු පද්ධතිය හැකි ඉක්මනින් ශුද්ධ කර දීමට කටයුතු සලස්වා දෙන මෙන් ඉල්ලා සිටීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය තමන් වෙත ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදන රුපියල් ලක්ෂ 08 න් ඉතිරි වී ඇති මුදල වැය කර 06.01.01 යෝජනාව ඉටු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ද නැවත ධාරානිපාත වර්ෂාවක් ඇද හැලීමට පෙර දොරවෙල ඔය ඉහළ කොටසේ ගඟට කඩා වැටී ඇති ගස් දෙක කපා ඉවත් කර දෙන ලෙස ද පවසන ලදී. එමෙන්ම හුණුකුඹුර, බළන්ගොඩ ගෙදර පහළ කොටසේ නිවාස 10 ක් අසලින් තිබෙන 200m පමණ දිග කාණු පද්ධතියෙහි පවතින පස් නගර සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යොදා ඉවත් කර කාණුව සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් දොරවෙල ගඟට කඩා ඇති ගස් ඉවත් කිරීම සඳහා සහ ගඟ ශුද්ධ කිරීම සඳහා වන ඇස්තමේන්තුව හා වාර්තාව ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති අතර අනුමැතිය ලැබූ වහාම එය ඉටු කරන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06.02 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

06.02.01 ගොරොක්ගහමඩ බෙතෙල්හිල් මාවතට වේග සීමා අවම කිරීම සඳහා වැටි කිහිපයක් සකස් කිරීම හා වේග සීමා බෝඩ් සවි කිරීම.

06.02.02 දෙහිගස්තලාව මුස්ලිම් දේවස්ථානය පිටුපස ආරක්ෂක පැති බැම්ම ඉතිරි කොටස නිම කිරීම.(ඇස්තමේන්තු මුදල දළ වශයෙන් - රු. 200,000.00)

06.02.03 බළන්ගොඩ - මිරිස්වත්ත සුබයිර් ආලීම් මාවත අල් ඊමාන් පෙර පාසල සංවර්ධනය කිරීම සඳහා උපකරණ ලබා දීම. රු.100,000.00

06.02.04 මිරිස්වත්ත සුබයිර් ආලීම් මාවතේ ගලා බසින වැසි ජලය පුද්ගලික ඉඩමෙහි (එම්.රෆායිදීන් හාජ්යාර් මහතාගේ ඉඩම) රැඳී සිටින බැවින් වැසි ජලය ක්‍රමවත් විදිහට කහටපිටිය පාරට හැරවීම හෝ සුබයිර් ආලීම් මාවත හරහා හෝ කහටපිටිය පාරට හැරවීමට කඩිනමින් විසඳීමක් ලබා දීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින්, ගොරොක්ගහමඩ බෙතෙල්හිල් මාවතේ නිවාස මාර්ගය අසළම පිහිටා ඇති අතර කුඩා දරුවන් නිතරම මාර්ගයට එන බවත්, එහි ගමන් කරන වාහන අධික වේගයෙන් ගමන් කරන බැවින් වේග සීමා අවම කිරීම සඳහා වැටි කිහිපයක් සකස් කරන ලෙස හා වේග සීමා බෝඩ් සවි කරන ලෙසත් පවසන ලදී.

එමෙන්ම 06.02.02 හා 06.02.03 යෝජනාව තම මන්ත්‍රී ප්‍රතිපාදන තුළින් සිදු කරන බවද, මිරිස්වත්ත සුබයිර් ආලීම් මාවතේ ගලා බසින වැසි ජලය හා ඒ සමග පැමිණෙන පොල් කෝම්බ එම්.රෆායිදීන් හාජ්ජියාර් මහතාගේ ඉඩමේ රැඳී පවතින බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් දඩ ගසා ඇති බවද, මේ නිසා එම නිවැසියන් මහත් අපහසුතාවයකට පත්ව ඇති බව ද පැවසීය. එබැවින් වැසි ජලය ක්‍රමවත් ලෙස කහටපිටිය පාරට හැරවීම හෝ සුබයිර් ආලීම් මාවත හරහා කහටපිටිය පාරට හැරවීම සඳහා කඩිනමින් විසඳීමක් ලබා දෙන ලෙස පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත 06.02.04 යෝජනාව අනුව එම කාණුව සුබයිර් ආලීම් මාවත වෙත ගෙන ඒම සඳහා විශාල වියදමක් වැයවන බැවින් මේ සඳහා ඇති හොඳම විසඳුම වන්නේ එම ඉඩම හරහා ස්ලැබ් යොදා කාණුවක් ඉදි කිරීම බවද එය සභාවේ යුතුකමක් හා වගකීමක් වන බව ද එමගින් මහජන මුදල් ඉතිරිකර ගැනීමට හැකි වන බවද පවසන ලදී.

එමෙන්ම මෙය දැවෙන ප්‍රශ්නයක් වන බැවින් මෙම කාර්යය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සිදු කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06.03 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

06.03.01 නගර සභාව ඉදිරිපිට, කරව්කැටිය පාර, උඩකන්ද පාර, දැනට කලක සිට පවතින විශාල වලවල් ප්‍රතිසංස්කරණය කිරීම.

06.03.02 කොටුගොඩැල්ල පාර කාණු පද්ධතිය වැසි ජලය හා පස් වැටී ඇති නිසා එය පිළිසකර කර දීම.

06.03.03 බළන්ගොඩ නගරයේ දැනට ඇති අනවසර ඉදිකිරීම් කර්මාන්ත කමිටුව හා මන්ත්‍රී කණ්ඩායම සමග ගොස් ඉවත් කිරීම.

06.03.04 හුණුකුඹුරට හැරෙන මාර්ගයේ (තුඹගොඩ කොටසට අයත්) පාර නඩත්තු කටයුතු වලින් පිළිසකර කර දීම.

06.03.05 RDA සමග කථා කර තුඹගොඩ බස්නැවතුම්පල ප්‍රධාන පාර දිගට සෑදීමට කටයුතු කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් කරව්කැටිය පාරෙහි විශාල වශයෙන් වලවල් සෑදී ඇති බැවින් ඉක්මනින් ප්‍රතිසංස්කරණය කරන ලෙසද කොටුගොඩැල්ල පාරෙහි 100 m ක් පමණ වන කොටසක පමණක් කාණුව යොදා නොමැති

නිසා එය සකස් කර දෙන ලෙසද බළන්ගොඩ නගරයේ ගංවතුර ඇතිවීම සඳහා තුඩුදුන් එක් හේතුවක් වන අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙසද පවසන ලදී.

එමෙන්ම තුඹගොඩ පන්සල පිහිටි ඉඩමෙහි මගී බස්නැවතුම්පල ඉදිකිරීම සඳහා විහාරාධිපති හිමියන් කැමැත්ත ප්‍රකාශ කළද පසුව එම ඉඩම් කොටස කඩ කාමර පේළියක් ඉදිකිරීම සඳහා ලබා දී ඇති බවද මේ නිසා ප්‍රශ්නයක් ඇති වේයැයි සිතන බැවින් තුඹගොඩ මගී බස්නැවතුම්පල ප්‍රධාන පාර දිගට කාණුව මත සකස් කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06.04 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06.04.01 වැවවත්ත ප්‍රජා ශාලා ගොඩනැගිල්ල, බුදු මැඳුර සහ වැසිකිළිය ප්‍රතිසංස්කරණය කිරීම

06.04.02 වැවවත්ත ප්‍රජා ශාලා පරිශ්‍රයේ ක්‍රීඩාපිටිය,වැට මායිම තණකොළ කපා ඉවත් කිරීම.

06.04.03 බළන්ගොඩ නගරයේ වීථිවල බලා කියා ගැනීමට කිසිවෙකු නැති අසරණ වැඩිහිටියෝ (යාචකයින්) ප්‍රජා නිවාසගත කිරීමට කටයුතු කිරීම.

06.04.04 බළන්ගොඩ නගර සභා පොදු සුසාන භූමියේ ඇති අඩුපාඩු සහ නඩත්තු කටයුතු පිළිබඳ සභාවේ අවධානය යොමු කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, ඉහත සඳහන් 06.04.01 යෝජනාව 2018 අගෝස්තු මස මහ සභාවේදී සම්මත වූ යෝජනාවක් වන අතර ඒ සඳහා මිළ ගණන් කැඳවූ නමුත් එහි කටයුතු අතරමග නැවතී ඇති බව පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගරයේ වීථිවල අසරණ වැඩිහිටියන් හතරදෙනෙකු සිටින අතර ඔවුන්ව ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මගින් අධිකරණය වෙත ඉදිරිපත් කර ඒ හරහා නීත්‍යානුකූලව රිදීගම ප්‍රජා නිවාසයට වෙත භාරදිය හැකි බව පවසන ලදී.
වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා, සුසාන භූමියේ ජලය නොමැති බවද, තණකොළ වැවී ඇති බවද වැසිකිළිවල දොරවල් හා බල්බ් නොමැති අතර වහලය දිරාපත් වී ඇති බව ද සඳහන් කරමින් එම අඩුපාඩු සකස් කර දෙන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06.05 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

06.05.01 දෙවට පාරේ ගෙවල්වල වැටීමට ආසන්න විශාල ගස- සුමිත්‍රපාල මාරපන මහතාගේ නිවස අසළ ඇති විශාල ගස ඉවත් කිරීමට උනන්දු වීම.

06.05.02 මුගුණමලය මාර්ගයේ මුල කොටසේ ඇති පැති කාණුව සෑදීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී 06.05.01 යටතේ සඳහන් කර ඇති ගස බෝ ගසක් වන අතර එමඟින් නිවාස ගණනාවකට අවහිරයක් වී ඇති බවද හැකිනම් අතු ටික හෝ කපා ඉවත් කර දෙන ලෙස ඉල්ලීමක් කළ බව ද මුගුණමලය මාර්ගයේ මුල කොටසේ ඇති පැති කාණුව හැකි ඉක්මනින් සාදා දෙන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.06 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

06.06.01 ඕලුගංතොට ගොවි සංවිධානයට බුෆේ කට්ටලයක් ලබා දීම.(පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. ඇස්තමේන්තු අනුමත කිරීම**

**07.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

07.01.01 පල්ලෙකුඹුර මාර්ගයේ 1 වන පටුමඟ කාණුවේ ඉතිරි කොටස ඉදි කිරීම. රු.291,000.00

07.01.02 කරවිකැටිය මහමෙව්නා මාවතේ වම්පසට ඇති දෙවන අතුරු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම. රු.350,000.00

07.01.03 උඩ ඇල්ලපොල මහමෙව්නා දෙවන අතුරු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම. රු. 159,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.02 ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා**

07.02.01 උඩ ඇල්ලේපොල සමගි අවමංගල්‍යාධාර සමිති ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම රු.360,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.03 උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

07.03.01 ඒ.විලියම් මාවතේ රණවක මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. රු.656,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.04 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා**

07.04.01 කිරිඳිගල අනඳමෙත් ගම සියඹලාගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම.රු.500000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.05 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07.05.01 හුණුකුඹුර ගාලවත්ත සරත් කුමාරසිරි මහතාගේ නිවස අසල අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. රු.222000.00

07.05.02 යූ.ඒ.නිශ්ශංක කුමාර මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. රු.245000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.06 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

07.06.01සෝමා කන්දෙගෙදර මහත්මියගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම. රු.186000.00

07.06.02 බිංදු මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම.රු.284000.00

07.06.03 අනඳමෙත්ගම යසවතී හෙට්ටිආරච්චි මහත්මියගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම. රු.150,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 2,121,582.73 |
| වෙනත් ලැබීම් | 568,899.96 |
| මුලු ලැබීම් | 21,784,482.69 |
| පුනරාවර්තන වියදම් | 7,753,868.99 |
| වෙනත් වියදම් | 2,034,467.49 |
| මුලු වියදම් | 21,784,482.69 |

2020-05-01 දින සිට 2020-05-31 දක්වා ඉන්ධන වාර්තාව

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---:|
| 56-1906 | 16,650.00 |
| 227-5020 | 41,905.00 |
| RD - 8240 | 27,590.00 |
| | 440.00 |
| 226-7521 | 18,928.00 |
| BC-0005 | 61,700.00 |
| GC 0001 | 15,182.00 |
| | 397.50 |
| LL - 7688 | 5,200.00 |
| RD 8000 | 11,440.00 |
| HF - 8558 | 7,280.00 |
| ZA 0228 | 7,830.00 |
| GK-1483 | 4,160.00 |
| GK-6227 | 14,070.00 |

| | |
|---|---|
| JD-4684 | 1,096.00 |
| LL-2110 | 7,077.00 |
| ND-5124 | 23,504.00 |
| PF-4006 | 22,176.00 |
| QL-2901 | 4,384.00 |
| 37-7933 | 3,640.00 |
| RC-1107 | 34,870.00 |
| RC 1118 | 12,785.00 |
| RC-8183 | 7,280.00 |
| DD Roller | 2,080.00 |
| oil spray | 1,370.00 |
| RE-2600 | 14,560.00 |
| UQ - 1933 | 2,740.00 |
| VI - 1833 | 1,096.00 |
| ZA 5039 | 41,184.00 |
| YG-0758 | 2,055.00 |
| **එකතුව** | **414,669.50** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ගංවතුර පැවති අවස්ථාවේදී පරණ පොදු වෙළෙඳසැල පිටුපස කාණුව අසළින් පළමු ජලකඳ ක්‍රීඩාංගණයට පැමිණි බවද ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පැමිණි ප්‍රධාන ලේකම්තුමිය සමඟ නිරීක්ෂණ චාරිකාවට ගිය අවස්ථාවේදී ගඟට අවහිරවන පරිදි බළන්ගොඩ නගරයේ අනවසර ඉදිකිරීම් සිදු කර තිබූ බව හඳුනාගත් අතර බස්නැවතුම්පල, මහජන පොළට හා නගරයට ගංවතුර ගැලීම සම්බන්ධව මන්ත්‍රීවරුන් මීට වඩා උනන්දු විය යුතු බව ද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සභාවට සහයෝගය ලබා දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගරය ලෝකයේම ජීවත් වීමට සුදුසුම නගර 10න් එකක් වන අතර නැවත වරක් ගංවතුර පැමිණියහොත් එම අභිමානය අපට අහිමි වන බව ද  නැවත ගංවතුරක් ඇතිවීමට පෙර අඩුපාඩු සකස් කළ යුතු බව ද පැවසූ අතර බස්නැවතුම්පල අසළ පාලම ආශ්‍රිතව ගඟේ විශාල වංගුවක් පවතින බැවින් එය සකස් කල යුතු බවද සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා පාලමේ සිට පහළට පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ පස්කන්ද ගඟේ සිට අඩි 20 ක් 25 ක් පමණ උසින් පවතින අතර ගඟ පැත්තට නෙරා ඇති බව ද සමහර ස්ථාන වල ගඟ අඩි

12 දක්වා පටු වී ඇති අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ යම් යම් අඩුපාඩු ඇති බවද පවසන ලදී.

මේ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රීතුමා පැවසුවේ පළමු වතුර පාර ගලා ආ ස්ථානය අසළ මාර්ගය අඩි 5 ක් 6ක් උස්සා සකස් කර, ගංඉවුර මත ගැට්ටක් සකස් කළ යුතු අතර එමගින් පිට්ටනියේ විශ්කම්භය අවශ්‍ය පරිදි සකස් කළ හැකි බවයි. එමෙන්ම තමන්ට රජයෙන් කාපට් කි.මී.1 ක් ලැබෙන අතර එය නව මහජන පොළ අසල සිට කොන්ක්‍රීට් පාර දක්වා යොදන බවද නෝ පාකින් බෝඩ් යෙදීම නිසා වාහන නැවත්වීමට ස්ථානයක් නොමැති අතර පවතින එකම ස්ථානය වන්නේ බළන්ගොඩ නගර සභාවේ වාහන අංගනය පමණක් බව ද එබැවින් එම වාහන අංගනයෙන් අඩි 20 ක් 25 ක් පමණ ප්‍රමාණයක් පාරිභෝගිකයින්ගේ වාහන නැවැත්වීම සඳහා ලබා දෙන ලෙස ද පවසන ලදී.

ගංවතුර බැසගෙන යන අවස්ථාවේදී නගර සභාවේ ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය පැමිණ අවශ්‍ය ශුද්ධ පවිත්‍ර කිරීම් කළ අතර ඒ සඳහා සහයෝගය ලබා දුන් පොලිසිය හා ප්‍රාදේශිය ලේකම්තුමාට ද ජල බවුසර් ආදිය ලබා දුන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ලාට ද ගංවතුර දිනට පසු දින ගරු උප සභාපතිතුමා තමන් සමඟ නගරයේ සංචාරය කිරීම සඳහා පැමිණි බැවින් එතුමාට ද ස්තුතිය පළ කළ ගරු නාගරික මන්ත්‍රීතුමා, තමන්ට පුද්ගලයෙකු අභියෝග කල බැවින් බස්නැවතුම්පල මුරකුටිය හා පොලිස් මුරපොල විවෘත කරන අවස්ථාව තමන්ට පවසන ලෙස ද සරස්වතී වත්ත සුසාන භූමියේ සුසාන ගෙයි වහලය අබලන් වී ඇති බැවින් එය සකස් කරන ලෙස ද පදික කඩ කාමර 32 හි බඩු දැමීම සඳහා සීමා සළකුණු කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

කොරෝනා ව්‍යාප්ති තත්ත්වය හා ගංවතුර තත්ත්වය නිසා බළන්ගොඩ ජනතාවගේ ජන ජීවිත අඩාල වූ අතර රජය විසින් ජන ජීවිත යථාවත් කිරීම සඳහා වැඩපිළිවෙළ සකස් කරමින් පවතින බව ද පළාත් පාලන ආයතනයක් ලෙස ජනතාවට සහනයක් සලසන ලෙසද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය බැවින් නව ආදායම් උත්පාදන ක්‍රම සකස් කරන ලෙසද සංවර්ධන කටයුතු සිදු කිරීමේදී කර්මාන්ත කමිටුව කැඳවීම අවශ්‍ය බැවින් කර්මාන්ත කමිටුව කැඳවන ලෙසද පවත්නා තත්ත්වය නිසා මාස තුන හතරක් කර්මාන්ත කටයුතු ප්‍රමාද වූ බැවින් නැවත වරක් හැකි ඉක්මනින් එම කටයුතු ආරම්භ කිරීම සඳහා කටයුතු සකස් කරන ලෙසද සභාවේ කාල සීමාව කෙමෙන් කෙමෙන් ගෙවී යන බව ද පවසන ලදී.

එමෙන්ම දොරවෙල ඔය සඳහා බැම්මක් සකස් කිරීම සඳහා තමන් පෙර සභාවකදී යෝජනා කළ අතර ඒ සඳහා ගම්වැසියන් විසින් වැලි හා ශ්‍රම දායකත්වය ලබා දෙන බවත්, අවශ්‍ය ගල් හා සිමෙන්ති ලබා දෙන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

පසුගිය කොරෝනා වසංගතය නිසා සම්පූර්ණ වැඩ කටයුතු අඩාල වූ අතර නඩත්තු කටයුතු කඩිනමින් කරන ලෙසද ක්‍රීඩාංගණය පාරෙහි ඇති වලවල් වසා දෙන ලෙසද මොහාන් සාලිය එල්ලාවල මාවතෙහි ආලෝක බල්බ් පද්ධතිය හැකි ඉක්මනින් සකස් කරන ලෙසද පවසන ලදී.

එමෙන්ම සුබයිර් ආලීම් මාවත ජල ගැටළුව පිළිබඳ අවධානය යොමු කරන ලෙසද නගරයේ පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් නිසා නගර සභාවට කිසිඳු සංවර්ධන කටයුත්තක් හෝ අලංකාර කටයුත්තක් සිදු කළ නොහැකි බවද සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා, ඔවුන් සමඟ සාකච්ඡාවක් සිදු කර විසඳුමක් ලබා ගන්නා ලෙසද නිළධාරීන් කැඳවන විට තීන්දු තීරණයක් ගැනීමට හැකි නිළධාරීයෙක් ගෙන්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ලොව තුළ පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හා ගංවතුර තත්ත්වයෙන් බොහෝ ජනතාව අසරණ තත්ත්වයට පත්වූ අතර එම ජනතාව ආරක්ෂා වන පරිදි සභාවෙන් තීන්දු ගත යුතු බවත්, ගංවතුර පිළිබඳ විශේෂ මහ සභාව හා නිරීක්ෂණ චාරිකාව සඳහා තමන් සහභාගි වූ නමුත් ඒ සඳහා මන්ත්‍රීවරු කිහිපදෙනෙක් පමණක් සහභාගි නොවීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බවත් පවසන ලදී. එමෙන්ම නිරීක්ෂණ චාරිකාවේ දී ගඟෙහි සකස් කළ යුතු ස්ථාන දුටු අතර සමහර බැමි නිසා ගඟ පටු වී ඇති බවද අනවසර බැමි ඉදිකර තිබූ බව ද දොරවෙල කුඹුරු ගොඩ කිරීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇති බැවින් එම අධිකාරිය හරහා ගඟ පුළුල් කිරීම කර ගත යුතු බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු මන්ත්‍රීතුමා නගර සභාවේ පවතින කර්මාන්ත කමිටුව හා ඉතිරි කමිටු සක්‍රීය කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගයන්හි ගමන් කිරීම සඳහා බොලේරෝ ට්‍රක් එකක් ලබා ගැනීමේ තත්ත්වය හා ගංවතුර තත්ත්වයෙන් ආපදාවන්ට පත්වූවන් සඳහා රු.10,000ක දීමනාව ලබාදීමේ තත්ත්වය කුමක්දැයි විමසූ ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, දොරවෙල හුණුකුඹුර මාර්ගයේ බුදුමැදුර සකස් කිරීමේ ඇස්තමේන්තුව සඳහා එක් දිනක් ඇතුළත මුදල් ලබා දීම පිළිබඳ එම නිළධාරීන් වෙත ස්තුතිය පුද කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා, විශේෂ මහ සභාව පැවති දින ගංවතුර ආපදාවට ලක්වූවන් සඳහා රු.10,000ක ආධාරයක් ලබාදීම සඳහා කළ යෝජනාව අනුව ඒ සඳහා අවශ්‍ය කටයුතු සලස්වා දෙන ලෙස පවසන ලදී.

එමෙන්ම සභා කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව තමන් අධ්‍යයනය කළ අතර එහි සභාපතිවරයාට අවශ්‍ය නියෝග නිකුත් කිරීමේ හා තනි බලය පාවිච්චි කිරීමේ හැකි ස්වරූපයක් දක්නට ලැබුණු බවද මාසයකට එක් දිනක් පමණක් සභාවට පැමිණෙන අතර එදින ද මන්ත්‍රීවරුන්ගේ කට වසා තැබීමේ අතුරු ව්‍යවස්ථාවක් වන බවද පවසන ලදී.

කොවිඩ් 19 වසංගතය පැමිණීමට පෙර සුදර්ශනපුර පාර 70%ක් සාදා අවසන් වූ අතර ඉතිරිය හැකි ඉක්මනින් සකස් කර දෙන ලෙස ද ගියවර සභාවේදී සංදේශ/ පැමිණිලි/ පෙත්සම් යටතේ ඉදිරිපත් කළ ව්‍යාපාරිකයින්ගේ ඉල්ලීම් සඳහා ලබා ගත් තීරණය එහි සඳහන්ව නොමැති බැවින් එය සඳහන් කරන ලෙස ද කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සහන ලබා ගැනීම සඳහා ලිපි ලබා දුන් ව්‍යාපාරිකයින් සඳහා සභාව විසින් ලබා ගන්නා ලද තීන්දුව සඳහන් කර ලිඛිතව දැනුම් දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම ඉතිහාසයේ පළමු වතාවට පෙට්ටිගලට ගංවතුර පැමිණි අතර පැය දෙකක් ඇතුළත ඇදහැලුණු අධික වර්ෂාව ඊට හේතුව වූ බවත්, ඉඩම් ගොඩ කිරීම නිසා මෙම ගංවතුර ඇති වූයේ නම් කොළනියේ පිහිටි නිවාස අටට ගංවතුර පැමිණියේ කෙසේදැයි විමසන ලදී. එබැවින් ජල ධාරිතාව වැඩිවීම නිසා මෙම ගංවතුර පැමිණි බව තම තර්කය බව ද දේපළ හානි වීම් වුණද ජීවිත හානි සිදු නොවීම සතුටට කරුණක් බව ද පවසන ලදී. එමෙන්ම සංවර්ධන කටයුතු කිරීම සඳහා මුදල් අවශ්‍ය බැවින් ගඟ සකස් කිරීම සඳහා සභා අරමුදලින් විශාල වියදමක් නොදරන ලෙසද පළාත් සභා අරමුදලින් හෝ මධ්‍යම රජය මඟින් මුදල් ලබා ගනිමින් සකස් කිරීම සුදුසු බවද ඉදිරියේදී වර්ෂාව එනවිට ජනතාව සූදානම් වන බැවින් හානිය අවම කර ගැනීම සඳහා ජනතාවට උපදෙස් ලබා දීම සුදුසු බවද එය ව්‍යාපෘති යෝජනාවට ඇතුළත් කර ගන්නා ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්, එක් පුද්ගලයෙක් බස්නැවතුම්පලේ රාත්‍රියට ගිනිමැල ගසා උයා කන අතර එය අවදානම් බැවින් එය නතර කරන ලෙස පවසන ලදී.

**10. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අද දින සභාව හොඳ මට්ටමින් ක්‍රියාත්මක වූ අතර මාර්තු මස සිට ව්‍යවසන කිහිපයකට මුහුණ දුන් බවද එම අවස්ථාවලදී ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය නගර සභාවේ කාර්ය මණ්ඩලය මෙන්ම ඒ හා අනුබද්ධිත රාජ්‍ය ආයතන ක්ෂණිකව එම අවස්ථාවට ගැලපෙන ලෙස ක්‍රියාත්මක වී බළන්ගොඩ නගරය හා නගර වැසියන් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ බව ද පවසන ලදී.

එමෙන්ම රටේ කුමන හෝ කර්තව්‍යයක් සිදුවන විට රජය විසින් ජනතා සේවයට යවන්නේ පළාත් පාලන ආයතනය වන අතර කොවිඩ් 19 වසංගතය පවතින අවස්ථාවේදී මධ්‍යම රජයට යාමට නොහැකි සේවාවන් පවා පළාත් පාලන ආයතන කළ බව සඳහන් කළේය. එමෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පොලීසිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවශ්‍ය යාන වාහන

සේවකයන් මෙන්ම අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දුන් අතර බළන්ගොඩ නගර සභාවේ පොදු අරමුදලින් විෂබීජනාශක දියර ගෙන විෂබීජහරණය කිරීමට කටයුතු කළ නමුත් පළාත් පාලන අයතන සම්බන්ධ කිසිඳු ඇගයීමක් මුලු රටේම සිදු නොකළ බව පැවසූ ගරු සභාපතිතුමා, තම ජීවිත හා පවුල් පිළිබඳව නොසලකා විශාල අවදානමක් ගෙන සේවකයින් දිවා රෑ නොබලා සේවය කළ බව පැවසීය. මධ්‍යම රජය, පොලිසිය, ත්‍රිවිධ හමුදාව හා සෞඛ්‍ය අංශ කළ කැපකිරීම වෙනුවෙන් ඇගයීමක් තිබූ නමුත් පළාත් පාලන ආයතන වෙත කිසිඳු ඇගයීමක් රටේ කොතනක හෝ නොතිබූ බව ද මධ්‍යම රජය තීන්දු තීරණ ගැනීමට ප්‍රථම අවශ්‍ය තීන්දු තීරණ ගෙන ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතනයක් වන බළන්ගොඩ නගර සභාවේ සභාපති ලෙස ඒ වෙනුවෙන් තම කණගාටුව පළ කරන බවත් පැවසීය. එය කෙසේ වුවද බළන්ගොඩ නගරයේ ජීවත් වන 37000 කට ආසන්න ජනතාව අතරට ගොස් සියලු ප්‍රජාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සහ සේවාවන් බළන්ගොඩ නගර සභාව සැපයූ අතර බළන්ගොඩ නගර සභාවට බදු ගෙවන ජනතාවට ඉටුවිය යුතු සේවාවන් ඉටු කිරීමට හැකිවීම පිළිබඳව නිහතමානිව සතුටුවිය යුතු බවද පුද්ගලික හිතවතුන් හා ව්‍යාපාරික මහතුන් හැකි සෑම අවස්ථාවේදී උදව් උපකාර කළ බැවින් ඔවුන්ට බළන්ගොඩ නගර සභාවේ සභාපති ලෙස තම ස්තූතිය පුද කරන බව ද ප්‍රකාශ කරන ලදී.

ගංවතුර වෙනුවෙන් ආපදාවට ලක්වූ ප්‍රජාවට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව ආධාරයක් ලබා දෙන බව ද සුනාමිය මේ රටට පැමිණි වෙලාවේ කිසිවෙකු සූදානම් නොවූ ආකාරයෙන්ම මෙම ගංවතුර ද අනපේක්ෂිතව පැමිණි අතර මේ සඳහා මිනිස් ක්‍රියාකාරකම් කිහිපයක් බලපෑ නමුත් අධික වර්ෂාව නිසාම මෙය ඇතිවූවක් බව ද පවසන ලදී. එමෙන්ම වතුර බැසයෑමේදී ඇති වූ බාධා නිසා බළන්ගොඩ නගරය යටවූ බවද ගංවතුර වැළැක්වීම සඳහා හිටපු සභාපතිතුමාගේ කාලයේදී UN Habitad සමඟ එක්ව දොරවෙල ඔය ව්‍යාපෘතිය සිදු කළ අතර ඒ සඳහා එවකට සිටි මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා කැපවීමක් සිදු කළ බව ද එම ව්‍යාපෘතිය මඟින් ගංවතුර වළක්වා බළන්ගොඩ නගරය පිළිබඳ ලෝකයේ හොඳ නමක් සටහන් කළ නමුත් අද වන විට කුඩා වර්ෂාවක දී වුව ද ජනතාව බියට පත් වන නිසා ජනතාවගේ එම බිය ඉදිරියේ දී නැති කිරීමට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු බවද ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය අවශ්‍ය බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ප්‍රාදේශිය සභා සීමාව තුළ ඉඩම් ගොඩකිරීම් සිදු කර තිබුණද එහි වාණිජමය වශයෙන් පාඩුව නගර සභාව වෙත තිබෙන බව පැවසූ ගරු සභාපතිතුමා අද දින සභාවට සහභාගි වූ ගරු උපසභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය, මාධ්‍යවේදීන් හා ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරිතුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට තම ස්තූතිය පුද කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.